# ප්‍රසම්පාදන දැන්වීමයි

# රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

# ස්වදේශ කටයුතු අංශය

## ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය භෞතික සම්පත් සැපයීම වෙනුවෙන් ලංසු කැඳවීම - 2025

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවාවන්ගේ කාර්යක්ෂමතාවය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම උදෙසා නවීන තාක්ෂණය භාවිතය හා ඩිජිටල්කරණය අවශ්‍ය වන බැවින්, සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි තෝරා ගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 25 ක් සඳහා මූලික අදියර වශයෙන් භෞතික සම්පත් සැපයීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය විසින් ලංසු කැඳවනු ලැබේ.

02. 2025.07.11 දින සිට 2025.07.30 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 03.00 දක්වා ආපසු නොගෙවන රු. 12,500.00 ක ගාස්තුවක් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයේ, 16 වන මහලේ පිහිටි මූල්‍ය අංශයේ සරප් අංශය වෙත ගෙවා, ලබා ගන්නා වූ රිසිට්පත සමඟ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් නමින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රසම්පාදන ශාඛාවෙන් ලංසු ලියවිලි ලබා ගත හැක. එකී සඳහන් කාල සීමාව තුළ දී www.moha.gov.lk වෙබ් අඩවිය මඟින් ලංසු ලේඛන පරික්ෂා කිරීමේ අවස්ථාව සැපයුම්කරුවන් වෙත ලබා දී ඇත.

03. මුද්‍රා තබන ලද ලංසු '**මුල් පිටපත**' හා '**අනු පිටපත**' වශයෙන් පිටපත් දෙකකින් යුතුව වෙන වෙනම මුද්‍රා තබා සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි බහාලන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ස්වදේශ කටයුතු අංශය සඳහා ඩෙක්ස්ටොප් පරිගණක, ලැප්ටොප්, ටැබ්, පරිලෝකන යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් සහ UPS සැපයීම, බෙදා හැරීම, ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම සඳහා ලංසු කැඳවීම - 2025**" යනුවෙන් සඳහන් කර 2025.08.01 දින පෙ.ව. 10.00 ට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් හෝ 'නිල මැඳුර', ඇල්විටිගල මාවත, කොළඹ 05 පිහිටි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - ස්වදේශ කටයුතු අංශයේ 16 වන මහලේ මූල්‍ය අංශයේ ප්‍රසම්පාදන ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් ලංසු ඉදිරිපත් කළ හැක. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු 2025.10.30 දින දක්වා වලංගු විය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් ලංසු ඉදිරිපත් කරන්නේ නම් පහත ලිපිනයට එවිය යුතුය. (ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

ගණකාධිකාරී (ප්‍රසම්පාදන),
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
ස්වදේශ කටයුතු මූල්‍ය අංශය
16 වන මහල,
නිල මැඳුර,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

04. ලංසු භාර ගැනීම 2025.08.01 වන දින පෙ.ව. 10.00 ට අවසන් වූ වහාම 'නිල මැඳුර' ගොඩනැඟිල්ලෙහි 16 වන මහලෙහි පිහිටි ස්වදේශ කටයුතු මූල්‍ය අංශයේ දී එනම්, 2025.08.01 දින පෙ.ව. 10.10 ට ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසු කරුවන්ට හෝ ඔවුන් විසින් ලිඛිතව බලය පවරන අයෙකුට සහභාගී විය හැක.

වැඩි විස්තර සඳහා දුරකථන අංකය - 011-20504162

**සභාපති, (ලේකම්)**
**ප්‍රසම්පාදන කමිටුව,**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - ස්වදේශ කටයුතු අංශය**
**"නිල මැඳුර",**
**ඇල්විටිගල මාවත,**
**නාරාහේන්පිට,**
**කොළඹ 05.**